# වෘකයන්ට බැටළුවන් බාරදීම:
# ශ්‍රී ලංකාවේ
# සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

# වෘකයන්ට බැටළුවන් බාරදීම:
# ශ්‍රී ලංකාවේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය

## විධායක සාරාංශය

අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ආණ්ඩුව විසින් පිහිටුවා ඇති අලුත් ආයතනයට කරන ලද පත්වීම් තුනක් නිසා එම පත් කිරීම් වල යෝග්‍යතාව පිළිබඳ ඉතා බරපතල ගැටළු මතුවී තිබේ. මේ පත්වීම් අතර වධකයකු ලෙස චෝදනා ලබන බවට එක්සත් ජාතීන්ගේ වාර්තාවක නම් කර ඇති එක් අයකුත්, රැඳවියන්ට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතියක් නොතිබුනා වූද, ඔවුන්ට බරපතල වධහිංසා පමුණුවන ලද බවට විස්තර කෙරුනා වූද පශ්චාත් යුද "පුනරුත්ථාපන" කඳවුරු භාරව සිටි නිලධාරියාත් වෙයි. මේ තත්වයන් යටතේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ වලට විරුද්ධව සත්‍ය කොමිසමක හෝ අධිකරණයක හෝ සාක්ෂි දීමට යන කිසිදු වින්දිතයකුට රජයෙන් රැකවරණයක් ලබා ගැනීම අපේක්ෂා කළ නොහැකිය.

ශ්‍රී ලංකාවේ රජය තම ජනතාවට පොරොන්දු වූ වගවීම් ක්‍රියාවලියේ හදවත වන්නේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාවයි. කවදා හෝ දිනක වධහිංසා සම්බන්ධයෙන් නඩු විභාගයකට මුහුණ දීමට සිදුවන පුද්ගලයන් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ආයතනයකට පත් කිරීම බැටළුවන් රැකීම වෘකයන්ට භාර දීමට සමානය. මේ නිසා සිය කැපවීම සම්බන්ධයෙන් ජාත්‍යන්තරවද, යුක්තිය ඉටු කරන බවට සිය ජනතාවටද පොරොන්දු දුන් ආණ්ඩුවේ හොඳ හිත සම්බන්ධයෙන් බරපතල ප්‍රශ්න මතුවේ.

මීට අමතරව, සාක්ෂිකාර ආරක්ෂාව ශක්තිමත් කිරීමටත්, සියලුම රජයේ නිලධාරීන් ගේ මානව හිමිකම් වාර්තාව සම්බන්ධයෙන් සුලමුල සෝදිසි කිරීමටත්, 2015 එක්සත් ජාතීන්ගේ යෝජනාවෙන් ශ්‍රී ලංකාව දුන් පොරොන්දු මේ පත්වීම් මගින් කඩ කෙරෙයි. මේවා ප්‍රශ්නකාරී පත්වීම් පමණක් නොවේ; කලක් ශ්‍රී ලංකාවේ වඩාත් අපකීර්තිමත් වධකස්ථානය පවත්වා ගෙන ගිය පුද්ගලයා විදේශ අමාත්‍යවරයා[1] විසින් වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට[2] ගිය ආණ්ඩුවේ නියෝජිත පිරිසට ඇතුලත් කිරීම 2016 නොවැම්බරයේදී අනුමත කරන ලදී.

1 අමාත්‍යවරයා ලන්ඩනයේ චැතම් හවුස් මන්දිරයේ රැස්වීමකදී, 2017 ජනවාරි 11 සහ Sri Lanka FM has no excuse for sending spy chief to UN (Video), ATHULA VI THANAGE, 2017 ජනවාරි 11, JDS Lanka, http://www.jdslanka.org/index.php/news-features/politics-a-current-affairs/658-sri-lanka-fm-has-no-excuse-forsending-spy-chief-to-un-video.

2 The Case Against Sisira Mendis, 15 November 2016, ITJP at http://www.itjpsl.com/assets/press/The-caseagainst-Sisira-Mendis-final.pdf

# 1. පසුබිම

## 1.1 සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව

යුද්ධයේදීත්, එහි අවසානයෙන් පසුවත්[3] සිදුවූ "ක්‍රම අපරාධ" ලෙසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වනු ලබන දේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ වගවීම කේන්ද්‍ර කොට ඇත්තේ සාක්ෂිකරුවන්ගේ/ කාරියන්ගේ ආරක්ෂාවයි. සත්‍ය කොමිසමක්, අතුරුදහන් වූවන් වෙනුවෙන් කාර්යාලයක් සහ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සාක්ෂි දීමට ඉදිරිපත් වෙනු ඇතැයි අපේක්ෂිත විශේෂ අධිකරණයක් පිහිටුවීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ජිනීවා නුවර මානව හිමිකම් මණ්ඩලයේ එක්සත් ජාතීන්ගේ 30/1 යෝජනාවෙන් ගිවිස ගත්තේය. එය සැබවින්ම ආරක්ෂා සහගත නම්, ශ්‍රී ලංකා යුද හමුදවට, පොලිසියට සහ ඔවුන්ගේ අතුරු සන්නද්ධ කල්ලි සගයන්ට එරෙහිව සාක්ෂි දීමට යුද අපරාධවලට ගොදුරු වුනු දෙමළ පීඩිතයන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වනු ඇත.

## 1.2 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට ආධාර දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත[4]

සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන අනපනත් පුනරීක්ෂණය කොට ශක්තිමත් කරන බවට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මානව හිමිකම් මණ්ඩලයේ 30/1 යෝජනාවෙන් සහතිකයක් ලබා දුන්නේය[5]. අද වන තුරුත් එය සිද්ධ වී නොමැත. මේ වාර්තාවේ අරමුණ වන්නේ මෑත ප්‍රවිචාරණ ක්‍රියාදමයෙන්ද[6] ඇතුළුව මැනවින් ලේඛනගතව ඇති එහි දුර්වලතා පිළිබඳව ඒ ආකාර විවේචනයක් කිරීම නොවේ. ඒ වෙනුවට මෙමගින් කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ සාක්ෂිකාර ආරක්ෂාව ක්‍රියාවේ යෙදවීම සඳහා බව පැවසෙන ආයතනය වන ජාතික අධිකාරියට මෑතදී කර ඇති පත් කිරීම් පිලිබඳ විශ්ලේෂණයකි.

## 1.3 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් මෙන්ම, පාලක මණ්ඩලයක් සහ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහාය දීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අංශයක් පිහිටුවීමටද සම්මත කිරීමට නියමිත නීතියෙන් නියම කර තිබේ[7]. මෑතදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද මහජන ප්‍රවිචාරණ වාර්තාවේ නිගමනය වූයේ අපක්ෂපාතී භාවය පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමට මේ කිසිදු ආයතනයක් සමත් නොවන බවත්, ඒවා ගොඩනගා ඇත්තේ "රජයේ නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් විභාග කිරීම පල රහිත කිරීම," සඳහා බවත් ය[8]. එසේ වන්නේ මේ පනතේ අරමුණු මෙසේ දක්වා තිබියදීය; *"අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ට අදාළව නිසි ජාත්‍යන්තර සම්මතයන්, ප්‍රමිති සහ යහ පිළිවෙත් ක්‍රියාවේ යෙදවීම සඳහා..."*

## 1.4 ජාතික අධිකාරියට පත්කිරීම්

ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන ගේ ආණ්ඩුවේ වර්ෂ පූර්ණය සනිටුහන් කිරීම සඳහා ජාතික අධිකාරිය ප්‍රකාශයට පත් කෙරුනේ 2016 ජනවාරියේය[9]. නිල බලයෙන් හත් දෙනකුද, ජනාධිපතිවරයා විසින් පස් දෙනකුද

---

3 චෝදනා සංඛ්‍යාවේ පරිමාණය, ඒවායේ බරපතල කම සහ පුනරාවර්තනය මෙන්ම කරන ලද ආකාරය සහ ඒවා වෙනසකින් තොරව සිදුකරන රටාව යනාදී සියල්ලෙන් පෙන්නුම් කෙරෙන්නේ ක්‍රම අපරාධයි." 2015 සැප්තැම්බර් 30, මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් සෙයිඩ් රාද් අල් හුසේන් වීඩියෝ මගින් මානව හිමිකම් කොමිසමට කළ ප්‍රකාශය.
http://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=16539&LangID=E#sthash.xN75VU ok.dpuf .

4 බලන්න: http://www.srilankalaw.lk/gazette/2015_pdf/4%20of%202015.pdf

5 එක්සත් ජාතීන්ගේ A A/HRC/RES/30/1 යෝජනාවේ මෙසේ සඳහන් වෙයි: "යාවත්කාලීන සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂකිරීමේ නීතිය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් මෑතදී යාවත්කාලීන කිරීම පිළිබඳව ප්‍රසාදය පල කරන මානව හිමිකම් මණ්ඩලය, සාක්ෂිකරුවන්, වින්දිතයන්, පරීක්ෂකයන්, අභිචෝදකයන් සහ විනිසුරන් පලදයී ලෙස ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මේ අත්‍යාවශ්‍ය ආරක්ෂණ ශක්තිමත් කරන ලෙස ආණ්ඩුව දිරිගන්වයි."

6 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට ආධාර දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: විවේචන සහ නිර්දේශ, රොසලින්ඩ් සිපෝස්, https://cpalanka.org/wpcontent/uploads/2007/10/_and_Witness_Protection_Bill.pdf

එමෙන්ම, සංහිඳියා යාන්ත්‍රණ සඳහා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ අවසාන වාර්තාව 2016 නොවැම්බර් 17, ඉංග්‍රීසි, 1 වෙළුම, 412 පිටුව.

7 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහාය දීම සහ ආරක්ෂා කිරීම සඳහා වන අංශය මේ වාර්තාවට අනුව 2016 නොවැම්බරයේ පිහිටුවා තිබේ. Sri Lanka Police establishes new division to assist and protect victims of crime and witnesses, 4 November 2016, Colombo Page, http://www.colombopage.com/archive_16B/Nov04_1478233087CH.php .

8 සංහිඳියා යාන්ත්‍රණ සඳහා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ අවසාන වාර්තාව 2016 නොවැම්බර් 17, ඉංග්‍රීසි, 1 වෙළුම, 413 පිටුව.

9 පොලිස් වෙබ් අඩවිය : http://www.police.lk/index.php/special-events-/2181-sri-lanka-police-officially-establishes-thedivision-for-assisting-and-protecting-victims-of-crime-a-witnesses-, Launch of National Authority for Protection of Victims, tomorrow, News.lk, http://www.news.lk/news/business/item/11659-launch-of-national-authority-forprotection-of-victims-tomorrow

ඒ සඳහා පත් කිරීමට නියමිතය. ඒ පස් දෙනා, "අපරාධවේදය, අපරාධ යුක්ති විනිශ්චය, මානව හිමිකම් නගා සිටුවීම සහ ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව යන වෘත්තීන් හෝ ක්ෂේත්‍ර වල පළපුරුද්ද," සහිත අය විය යුතුය.

ජනමාධ්‍ය වාර්තා අනුව ජාතික අධිකාරියට පත් කර ඇත්තේ මේ දස දෙනාය[10].

**ගැටළු සහගත සාමාජිකයන්:**

1. සුහද ගම්ලත් (සභාපති)
2. යසන්ත කෝද්‍රගොඩ
3. නන්දන මුණසිංහ
4. අශෝක විජේතිලක

**ගැටළුවක් මතු නොවන සාමාජිකයන්:**

5. ආචාර්ය එම්. ඒ. ඩී. එස්. ජේ. ශිරන්ජනී නිරිඇල්ල - නීති මහාචාර්ය[11]
6. ආචාර්ය නිමල් ප්‍රනාන්දු
7. සංජීව සමරනායක - හිටපු රාජ නීතිඥ[12]
8. හමීඩ් අල් ගසාලි - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ සාමාජික
9. නීල් හපුහින්න, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
10. ඩබ්. යූ. පී ප්‍රේමචන්ද්‍ර, කාන්තා හා ළමා කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

වින්දිතයන් හා සාක්ෂිකරුවන් බොහෝ දෙනා දෙමළ වී තිබියදීත් මේ ආයතනයට කිසිදු දෙමළ අයකු පත් නොකිරීම කැපී පෙනේ. එක මුස්ලිම් නියෝජනයක් පමණක් ඇති එහි 90%ක් සිංහලය.

---

10 "අපරාධයක සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය පිහිටුවීම ජනවාරි 08 වැනිද අධිකරණ ඇමති අතින් බත්තරමුල්ලේදී" 2016 ජනවාරි 7. කෙසේ වෙතත්, අලුත් සභාපතිවරයකු ගැන 2016 ජනවාරි 8 *Ceylon Times* හි *"NA for protecting victims and witnesses set up"* (තව දුරටත් අන්තර්ජාලයේ නොමැත). ඒ අනුව පත්වීම් ලබාදී ඇති අය අතර; "හමීඩ් ගසාලි හුසේන්, අතිරේක සොලිසිටර් ජෙනරාල් යසන්ත කෝද්‍රගොඩ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් නීල් හපුහින්න, කාන්තා හා ළමා කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්. යූ. පී ප්‍රේමචන්ද්‍ර සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (අපරාධ සහ රථවාහන) නන්දන මුණසිංහ. සභාපති වූයේ විශ්‍රාමික උපරිමාධිකරණ විනිශ්චයකාර විමල් නම්බුවසම්ය. වෙනත් සාමාජිකයන් අතර කොළඹ විශ්ව විද්‍යාල නීති පීඨයේ පොදු හා ජාත්‍යන්තර නීතිය පිළිබඳ දෙපාර්තමේන්තුවේ ආචාර්ය එම්. ඒ. ඩී. එස්. ජේ. ශිරන්ජනී නිරිඇල්ල, ආචාර්ය නිමල් ප්‍රනාන්දු, හිටපු නියෝජ්‍ය පොලිස්පති අශෝක විජේතිලක සහ නීතිඥ සංජීව සමරනායක. සභාපතිවරයා පත්කර මාස කිහිපයකින් ඉල්ලා අස්වූ අතර අනුප්‍රාප්තිකයා වූයේ සොලිසිටර් ජෙනරාල් සුහද ගම්ලත් ය. පත් කිරීමේ නෛතික ද්වේෂයක් තිබුනු බව අනාවරණය වූ නිසා මාස කීපයකට පසු සාමාජිකයන් නැවත පත් කිරීමේ අවශ්‍යතාවක් මතුවිය. අධිකාරියේ විශ්වසනීයත්වය කෙරේ ඇතිකරන ලද නිශේධනීය බලපෑම බරපතලය".

11 විශ්ව විද්‍යාල චරිතාපදානය: http://www.cmb.ac.lk/index.php/member/ms-m-a-d-s-j-s-niriella/

12 Petitioner interested only in clearing name of late brother — Counsel , Chitra Weerarathne , 2003 මාර්තු 1, The Island, http://www.island.lk/2003/03/01/news08.html අනුව ඔහු රාජ නීතිඥයකු (නැතහොත් නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අභිචෝදකයකු) ලෙස කටයුතු කර ඇත. 2001 දී: http://webcache.googleusercontent.com/search?q=cache:WcMyE8aPQVQJ:www.lawnetsl.com/wpcontent/uploads/2016/11/037-SLLR-SLLR-2001-V-3-DIAS-v.-DIRECTOR-OFCUSTOMS.pdf+&cd=6&hl=en&ct=clnk&gl=uk 13 Sri Lanka releases arrested pro-JVP newspap

## 2. චෝදනා

ජාතික අධිකාරියට පත් කර ඇති ඉතා බරපතල ගැටළු සහගත තුන්දෙනෙක් පිළිබඳ චෝදනා:

### 2.1 නන්දන මුණසිංහ

මුණසිංහ මහතා ත්‍රස්ත විමර්ශන ඒකකයේ (TID) හිටපු අධ්‍යක්ෂවරයාය. ඉන් පසුව ඔහු 2009 හා 2010 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID ) අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය පොලිස්පති බවට පත්විය[13]. TID පූර්ණ අධීක්ෂණය පවතින්නේ CID යටතේය. 2016 ඔක්තෝබරයේ ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බවට පත්විය[14].

එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මැන්ෆ්‍රඩ් නොවැක් 2007 දී කොළඹදී පිළිගැනීම ට ත්‍රස්ත විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ ලෙසින් පැමිණි නිලධාරියා ඔහුය[15]. රැඳවියන් තමන් හමුවීම වලක්වාලීම සඳහා නන්දන මුණසිංහගේ නියෝගයෙන් ඔවුන් මාරුකර යවා තිබුනු බව නොවැක් මහතා කියයි (25 ඡේදය). වධහිංසා කිරීමේ අපරාධ කරුවකු ලෙසින් චූදිත මුණසිංහ මහතා සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු බවත් ඔහු වැඩිදුරටත් පවසයි (13 ඡේදය, 30 පිටුව)[16].

"වගකිවයුත්තන් සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරනු පිණිස වධහිංසා සහ නොමනා සැලකීම් පිළිබඳ සියලු චෝදනා කඩිනමින් සහ ස්වාධීනව විභාග කරන ලෙස විශේෂ නියෝජිත නිර්දේශ කරයි. (උදා: අපරාධකරුවන් ලෙස චූදිත පොලිස් සමන්, පොලිස් කොස්තාපල් පෙරේරා, TID අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නන්දන මුණසිංහ ද ඇතුළුව TID පරිපාලකයන් මෙන්ම නිකුලස් ස්ටීවන්ට නොමනා සැලකිලි දැක්වීමට වගකිව යුතු CID නිලධාරීන්)[17]".

එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා විසින් නිර්දේශ කරන ලද පරිද්දෙන් ශ්‍රී ලංකා රජය කිසි විටෙකත් මුණසිංහ මහතාගේ වගවීම සාක්ෂාත් කළ බව පැවසෙන තොරතුරක් ප්‍රසිද්ධියට පත්වී නැත. ඒ වෙනුවට සිදුවූයේ මහින්ද රාජපක්ෂ පාලන සමයේ ඔහු නියෝජ්‍ය පොලිස්පති ධූරයට පත් කරනු ලැබ 2008 සහ 2009 වකවානුවේ මාස 10 ක් ඒ නිලයේ සේවය කිරීමයි[18]. වයඹ නියෝජ්‍ය පොලිස්පති ලෙසින් ඔහු 2010 අප්‍රේල් 27 වැනි දින පුත්තලමේදී රාජකාරි බාර ගත්තේය[19]. 2013 දී ඔහු නැවතත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරයට පත් කරන ලදී[20].

සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා බව පැවසෙන අලුතින් පිහිටුවන ලද  ආයතනයකට ඔහු 2016 ජනවාරියේ පත් කිරීමෙන් ජනාධිපති සිරිසේනගේ ආණ්ඩුව විසින් වගවීමටත් ශ්‍රී ලංකාවේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමටත් බරපතල ප්‍රහාරයක් එල්ල කර තිබේ.

---

13 *Sri Lanka releases arrested pro-JVP newspaper editor, 17 October 2009, Tamilnet; Several High-Ranking CID Officers Transferred, 20 April 210, The Sunday Leader,*

14 *The Police conducting special secret crime operation, 14 October 2016, Daily Ceylon, http://english.dailyceylon.com/the-police-conducting-special-secret-crime-operation/*

15 A/HRC/7/3/Add.6, *REPORT OF THE SPECIAL RAPPORTEUR ON TORTURE AND OTHER CRUEL, INHUMAN OR DEGRADING TREATMENT OR PUNISHMENT, MANFRED NOWAK, ON HIS MISSION TO SRI LANKA,* http://www2.ohchr.org/english/bodies/hrcouncil/docs/7session/A.HRC.7.3.Add.6_ch.pdf

16 එහිම

17 එහිම

18 සාක්ෂිය ලිපිගොනුවේ ඇත.

19 *DIG Nandana Munasinghe transferred again – this time to NW Range,* by SURESH PERERA, 2010 මැයි 2, The Island, http://www.island.lk/2010/05/02/news13.html

20 පොලිස් වෙබ් අඩවිය: http://www.police.lk/index.php/special-events-/686-passing-out-of-the-police-officers-whowere-trained-at-police-training-school--kaluthara

පනත අනුව, ජාතික අධිකාරියේ එක් රාජකාරියක් මෙසේ දැක්වේ: *"ශ්‍රී ලංකාවේ පොලිසියේ නිලධාරීන් ඇතුළු නීතිය ක්‍රියාවේ යෙදවීමේ නිරත රජයේ නිලධාරීන් සංවේදීකරණය...[21]"* චූදිත අපරාධකරුවකු ඒ කටයුත්ත කරනු විශ්වාස කිරීම අසීරුය.

මීට අමතරව, ප්‍රකට මාධ්‍යවේදියකු වන සිත්තම්පලම් තිස්සනායගම් ඔහුගේ අත් අඩංගුවේ රඳවා සිටියදී මුණසිංහ මහතා විසින් තර්ජනය කරන ලද බවට චෝදනා එල්ලවී ඇත.

"තිස්සනායගම්ට කතා කරමින් සිටියදී ඔහු හා සිවරාම් මාධ්‍යවේදියා අතර මිත්‍රත්වය ගැන TID අධ්‍යක්ෂ නන්දන මුණසිංහ විසින් සඳහන් කරන ලදී. සිවරාම් මියගිය ආකාරය මුණසිංහ මහතා විසින් විශේෂයෙන් මතක් කර දෙන ලදී. ඔහුගේ සිරුර හමු වූයේ පාර්ලිමේන්තු පරිශ්‍රය සමීපයේ පඳුරු ගොඩක් අතර තිබීය. මේ ආකාරයෙන් ප්‍රශ්න කිරීම වටහා ගන්නට නොහැකි වූ ඔහු ඒ ගැන බියපත් විය.[22]"

2009 ලෝක මාධ්‍ය නිදහස සඳහා වන දිනයේ සිය කතාවේදී එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා තිස්සනායගම් මහතාගේ සිද්ධිය විශේෂයෙන් හුවා දැක්වූයේ රැකියාවේ නිරතවීම නිසා සිරගත කෙරුනු මාධ්‍යවේදීන් පිළිබඳ සංකේතාත්මක උදහරණයක් ලෙසිනි[23].

මීටත් වඩා, තිස්සනායගම් මහතා සහ 2008 දීම TID විසින් රඳවා තබා ගනු ලැබූ තවත් මාධ්‍යවේදියකු සහ ඔහුගේ සහකාරිය - වෙට්ටිවේල් ජසිහරන් මහතා සහ වලර්මතී වඩිවේලු මෙනෙවිය - වෙනත් වගඋත්තරකරුවන් අතර මුණසිංහ මහතා ද නම් කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළහ[24]. මෙය ප්‍රසිද්ධ ලියවිල්ලකි.

## 2.1 සභාපති[25]: සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත්

ගම්ලත් මහතා දෙපාර්තමේන්තු රාජකාරියේදී ජ්‍යෙෂ්ඨත්වයෙන් දෙවැනි වන්නේ නීතිපති වරයාට පමණි[26]. ජනාධිපතිවරයාට සහ රාජ්‍ය ආරක්ෂක බලඇණි, පොලිසිය ඇතුළු රජයේ සියලු දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ සඳහා වන ප්‍රධාන නීති උපදේශකත්වය උසුලන්නේ නීතිපති දෙපාර්තමේන්තුවයි. යුක්තිය පසිඳලීම සම්බන්ධ ඕනෑම පරීක්ෂණයකදී රාජ්‍යයට, විශේෂයෙන්ම ආරක්ෂක අංශ වලට එරෙහිව සාක්ෂි දෙන්නවුන්ගේ ආරක්ෂාව නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පැවරීම ම සබැඳියා අතර ගැටුමක් වෙයි. ගම්ලත් මහතා රාජපක්ෂ පරිපාලනය යටතේ අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්වරයාද විය[27].

### (අ) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

මීට අමතරව ගම්ලත් මහතා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් ධුරයේ[28] 2007 සැප්තැම්බර් 12 සිට 2009 අගෝස්තු 7 දක්වා[29] රාජකාරි කළේය.

---

21 *ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES ACT*, No. 4 OF 2015, 7 March 2015, http://www.srilankalaw.lk/gazette/2015_pdf/4%20of%202015.pdf

22 *I was harassed by TID"-Tissainayagam, 10 November 2007*, T. Farook Thajudeen, https://freemediasrilanka.wordpress.com/tag/tid/

23 *Statement by the President in honor of World Press Freedom Day,* 1 May 2009, https://www.whitehouse.gov/the-press-office/statement-president-honor-world-press-freedom-day

24 *Tissainayagam, Jaseeharan, Valarmathi not seeking interim relief from court*, 28 August 2008, Tamilnet, https://www.tamilnet.com/art.html?catid=13&artid=26779

25 මුලින් පත් කරන ලද සභාපති මාස කිහිපයකින් ඉල්ලා අස් වී සුහද ගම්ලත් ඒ වෙනුවට පත් කරන ලද බව වාර්තා වී ඇත.

26 නීතිපති දෙපාර්තමේන්තු වෙබ් අඩවිය, http://www.attorneygeneral.gov.lk/index.php/the-law-officers

27 මාධ්‍ය වාර්තා අනුව, මහින්ද රාජපක්ෂ විසින් පත් කරන ලදුව සුහද ගම්ලත් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ලෙස 2007 සිට අඩුම වශයෙන් 2011 දක්වා කටයුතු කළේය: The confusing drama behind AG's appointment, 2016 පෙබරවාරි 24, http://www.sundaytimes.lk/160214/columns/the-confusing-dramabehind-ags-appointment-182829.html

28 පුනරුත්ථාපන අමාත්‍යාංශ වෙබ් අඩවිය: http://www.bcgr.gov.lk/cgrs.php

29 ළමුන් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායම 2009 ජූලි 1 ද නිව්යෝර්ක්හි පැවැත්වූ රැස්වීමේදී, සුහද ගම්ලත් කළ ප්‍රකාශයෙන්: *"මේ වනවිට බොහෝ ළමා සටන්කරුවන් හඳුනාගෙන ඔවුන් ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලට යැවීමේක්‍රියාදමය සිදුකෙරෙමින් පවතී... මේ ළමුන්ට සලකනු ලබන්නේ වින්දිතයන් ලෙස විනා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වල යෙදීම නිසා රඳවා ගෙන සිටින සැකකරුවන් ලෙස නොවේ": ශ්‍රී ලංකාවේ*

එක්සත් ජාතීන්ගේ විමර්ශන වාර්තාව[30] අනුව මේ ධුරයේ ඔහුගේ විශේෂ වගකීම පැවතියේ යුද්ධයේදී භාරවූ සියලු දෙනා සම්බන්ධයෙනි. මෙයින් අදහස් වන්නේ හිටපු එල්ටීටීඊ සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේදී වධ දීම නිතිපතා කෙරෙන්නක් වූ සමයේ රටපුරා "පුනරුත්ථාපන" කඳවුරු භාරව සිටියේ ගම්ලත් මහතාය යන්නයි. නඩු පැවරීමකින් හෝ අභියාචනය කිරීමේ අයිතියකින් තොර මහා පරිමාණ රැඳවුම් පද්ධතියක් අධීක්ෂණය කළ බවටද ඔහු චෝදනා ලබයි.

"පුනරුත්ථාපන කඳවුරු භාරව ඔහු සිටියේ 2009 අගෝස්තු 7 වැනිද තෙක් පමණක් වුවද, ගම්ලත් මහතාගේ වගකීම යටතේ තිබූ එම කඳවුරු වලදී ඒ කාලවකවානුව තුලදී ආයතනගත වධ බන්ධනයට ලක්වූ අයුරු විස්තර කරන 14 දෙනකුගේ සාක්ෂි ITJP සතුව තිබේ. මේ සමහර ස්ථාන වධකස්ථාන ලෙස එක්සත් ජාතීන්ගේ වාර්තාවේ ද (2015 OISL වාර්තාව, 547 ඡේදය) නම් කොට තිබේ: නෙල්ලිකුලම්[31], ඕමන්තෙයි මධ්‍ය මහා විද්‍යාලය, පම්පමඩු විද්‍යාලය, පූන්තෝට්ටම් කඳවුර, රම්බෙයිකුලම් විද්‍යාලය. "හමුදා කඳවුරු, පොලිස් ස්ථාන, "පුනරුත්ථාපන කඳවුරු" සහ බන්ධනාගාර ඇතුළු ස්ථාන ගණනාවකදී වධහිංසා කෙරුනු" (545 ඡේදය) බව එක්සත් ජාතීන්ගේ විමර්ශනයේ නිගමනය විය. එයාකාරයෙන් කරන ලද වධහිංසා "එක සමාන රටාවකින් ආරක්ෂක බලඇණි විසින් ස්ථාන ගණනාවකදී" කරන ලද ඒවා අනුගමනය කළ බවද (1129 ඡේදය) එහි සඳහන් වෙයි. මේ, වාර්තාවේ නිගමනයයි:

*"පුළුල් ලෙස පැතිරුනු ආකාරයෙන් මෙම වධබන්ධන පමුණුවන ලද බව පිළිගැනීමට සාධාරණ හේතු සාධක තිබේ. වධහිංසාව සපුරා තහනම් කිරීම සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සම්මුති සහ පිළිගත් ව්‍යවහාරයන් මෙමගින් උල්ලංඝනය කෙරේ. අධිකරණයක් හමුවේ තහවුරු කරනු ලැබුවොත්, මේ වධහිංසා පමුණුවනු ලැබුවේ පුළුල් ලෙස පැතිරුනු ආයතනගත ප්‍රහාරයක අංගයක් ලෙස නම්, පැවතුනු තත්වයන් අනුව, මානව වර්ගයාට එරෙහි අපරාධ ගනයෙහි ලා ගැනෙනු ඇත. යුද ගැටුම සමග එහි ඇති සම්බන්ධයක් තහවුරු කරනු ලැබුවොත් ඒවා යුද අපරාධ ගනයෙහි ලා ගැනෙනු ඇත." (1130 ඡේදය)*

**(ආ) "පුනරුත්ථාපන කඳවුරු" වින්දිතයෝ**

ගම්ලත් මහතා ගේ භාරයේ "පුනරුත්ථාපන" කඳවුරු තිබියදී ඒ තුල වධබන්ධනයට ගොදුරු වී දිවි ගලවා ගත් 14 දෙනකුගේ[32] සවිස්තර හා විශ්වසනීය සාක්ෂි වාචක ITJP සතුව තිබේ.

***රම්බෙයිකුලම් මහා විද්‍යාලය:*** 2009 මැයි ජූනි වලදී මෙහි වධහිංසාවට ගොදුරුවූ බවට හය දෙනකු සාක්ෂි වාචක දී තිබේ. මේ කාලය තුල ඔවුන් රඳවා තබා සිටි බව තහවුරු කිරීම සඳහා කිහිප දෙනකු අත ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් දුන් සහතික තිබුනත්, ඔවුන්ට කරන ලද නොමනා සැලකිල්ල සම්බන්ධයෙන් රතු කුරුසයට නොකියන ලෙස හමුදා භටයන් විසින් තර්ජනය කරන ලද බව පවසන ඒ සියලු දෙනා ඒ නිසා ඒ බව දැනුම් දී නැත.

විදුලි රැහැන්, පොලු, ක්‍රිකට් විකට් පොලු, බැටන් පොලු, වැලි පිරවූ ප්ලාස්ටික් බට සහ වතුර බැරල් වලින් සමන්විත ප්‍රශ්න කිරීම සඳහා යොදගන්නා කාමර වල කෙරුනු සැලසුම් සහගත ප්‍රශ්න කිරීම් මාලාවක් ගැන විස්තර සාක්ෂි වාචක වල සඳහන් වෙයි. යට ඇඳුමින් පමණක් හෝ නිරුවත්ව හෝ තබා හමුදා නිල ඇඳුමින් සැරසුනවුන් සහ සාමාන්‍ය ඇඳුමින් සිටි බුද්ධි අංශ නිලධාරීන් විසින් සිහි නැතිවනතුරු වද දුන් ආකාරය දිවි බේරාගෙන පැමිණි අය විසින් විස්තර කර තිබේ. පිටතට ගෙනයනු ලැබූ ඇතැමුන් ආපසු නොපැමිණි ආකාරයද ඇතැම් සාක්ෂිකරුවන් විසින් විස්තර කරන ලදී. ප්‍රශ්න කරනු ලැබීමෙන් පසුව බරපතල ලෙස තුවාල ලබා ඇවිද ගන්නටත් නොහැකිව කෙඳිරි ගාන සහවාසීන් සොල්දදුවන් විසින් ආපසු ගෙනත් දමනු ලැබූ ආකාරය තවත් සමහරුන් කළ විස්තර වල ඇත. ප්‍රමාණවත් ලෙස ආහාර නොදුන් බවටත්, වැසිකිලිය පාවිච්චි කිරීමට හෝ කෑම ලබා ගැනීමට පෙළ ගැසී සිටියදී සෙබළුන් විසින් හිතුමතේ පහර දෙන ලද බවටත් ඔවුහු චෝදනා කරති.

---

*ඇතැම් මානව හිමිකම් ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම, අතුරු වාර්තාව (GSP+ සම්බන්ධයෙන් කටයුතු කරන යුරෝපා කොමිසම වෙනුවෙන් ස්වාධීන විශේෂඥයන් තුන්දෙනකු විසින් සම්පාදනය කරන ලද්දකි)* Françoise Hampson, Leif Sevón සහ Roman Wieruszewski, *2009 අගෝස්තු 19.*

30 OISL (705 ඡේදය): *"ළමුන්ද ඇතුළුව යුද්ධයේදී 'භාරවූවන්' ට අදාලව විශේෂයෙන් වගකීම භාරගැනීම සඳහා ජනාධිපති රාජපක්ෂ 2006 සැප්තැම්බරයේදී පුනරුත්ථාපන අධ්‍යක්ෂ ජනරාල් වරයකු පත් කරන ලදී."*

31 නෙළුක්කුලම් යනුවෙන් ද ලියනු ලැබේ.

32 විවිධ කාල වකවානු වලදී "පුනරුත්ථාපන" වැඩ පිළිවෙලේදී වධහිංසා කරන ලද තවත් බොහෝ දෙනකු සමග ITJP සම්මුඛ සාකච්ඡා පවත්වා ඇති බව මෙහිදී සටහන් කිරීම යෝග්‍යය.

***නෙළුක්කුලම් කඳවුර:*** 2009 මැයි සහ ජූලි අතරතුර සාක්ෂිකරුවකුට හා සාක්ෂි කාරියකට කඳවුරේ වෙන් කළ ස්ථාන දෙකකදී වද දී තිබේ. කාන්තාවන් 400ක් සමග සිරගත කොට සිටි බව විස්තර කළ සාක්ෂිකාරිය කියා සිටියේ කිසිදු පුනරුත්ථාපනයක් සිදු නොකෙරුනු බවයි. ලේ ගලමින් සිහි නැතිවනතුරු ශාරීරික වධයට පමුණුවන ලද ආකාරයත් කිහිප වාරයක් ලිංගික වශයෙන් කෙලෙසන ලද ආකාරයත් ඇය විසින් විස්තර කරන ලදී. නිල ඇඳුමින් සිටි සොල්දදුවන් *"ප්‍රශ්න කරන කොට ඇඳුම් උඩින් මගේ රහස් ප්‍රදේශ අතගාමින් හිනාවෙවී සිටියා,"* යි ඇය ප්‍රකාශ කළාය. සාක්ෂිකරුවකු පැවසුවේ 2009 ජූලි මාසයේ සිට පිරිමි දෙදහසක් සමග නෙළුක්කුලමේ සිරකොට තබා ගනිමින් දිගින් දිගටම වධහිංසා කිරීමට ගෙනයන ලදුව තුන් වතාවක් ලිංගික වශයෙන් කෙලෙසන ලද බවයි. *"කිහිලිකරු වලින් යමින් හිටි මට ඒවා කැඩෙනකල් ඒවායින් ගහලා රයිපල් කඳකිනුත් ගැහුවා,"* යි ඔහු සාක්ෂි දී ඇත. ඊට අමතරව, ඔහුට මිරිස් කුඩු දමා, තල් පිති වලින් පහර දී, බලහත්කාරයෙන් මධ්‍යසාර පොවා තිබේ.

***පම්පමඩු:*** නොමනා සැලකීම්, කෑම හිඟකම සහ පුනරුත්ථාපනය සමග නොගැලපෙන බාල තත්වයන් සම්බන්ධයෙන් විස්තර කළ සාක්ෂිකාරයන් මෙන්ම සාක්ෂිකාරියන් දෙදෙනකු විසින් මේ කඳවුරේ වධහිංසා කෙරුනු ආකාරය ද විස්තර කරන ලදී. තමන් රහස් පොලිසියෙන් යයි කී සිවිල් ඇඳුමින් පැමිණි පිරිමින් විසින් එක් කාන්තාවක් හතර වතාවක් ප්‍රශ්න කර ඇත. ඇයට රයිපල් කඳන් වලින් පහරදී, ලැම, බඩ හා උකුල සිගරට් වලින් පුලුස්සා, හුස්ම හිරවන තුරු වතුරේ ඔබා තබා තිබේ. අගුලු දැමූ කාමරයක කාන්තාවන් පිරිසක් සමග සිටියදී, නිරුවත් කොට, අත් බිත්තියට තද කරගෙන හිටගෙන ඉන්නට කියා මහත් වැරෙන් තට්ටමට පහර දුන් ආකාරය තවත් කාන්තාවක් විසින් විස්තර කර තිබේ. වෙනත් සහවාසිනියන්ද එම කෙලෙසීමටම ගොදුරුවූ බව ඇය පවසයි. *"එතන වෙච්ච් පුනරුත්ථාපනයක් නෑ,"* යි ඇය කියයි, *"තව දුරටත් මානසික හා ශාරීරික හානි සිද්ධ වුනු එක විතරයි"*.

***වැලිකන්ද පුනරුත්ථාපන කඳවුර:*** 2009 පෙබරවාරියේදී භාර වීමෙන් අනතුරුව වව්නියාවේ පාසලකට යවන ලදුව, අල්ලාගන්නා ලද තවත් එල්ටීටීඊ සාමාජිකයන් 50 දෙනකු සමග කුඩුකර වද දුන් ආකාරය තවත් සාක්ෂිකරුවකු විසින් විස්තර කරන ලදී. ඉන් අනතුරුව ඔහු ගෙනයන ලද්දේ වැලිකන්ද "පුනරුත්ථාපන" කඳවුරටය. එහිදී ප්‍රශ්න කරන විට ගැට ගසා අතුල් පහරද, ගුටි බැටද දී ඇත. *"එතනදී මට කිසිම් පුනරුත්ථාපනයක් දුන්නේ නෑ. ඒක හිරගත කිරීමක් විතරයි. අපිට සැලකුවේ බර වැඩ දඬුවම් ලැබුණු අයට වගේ. සමහර වෙලාවට අපිව පාරවල් හදන්නයි, රෙපෙයාර් වැඩ වලටයි ගෙනිච්චා. අපිට සැලකුවේ වහලුන්ට වගේ,"* යි ඔහු පැවසීය.

***පූන්තෝට්ටම් මහා විද්‍යාලය:*** 2009 මැයි හෝ ජූනි මුලදී මෙහිදී ප්‍රශ්න කරන විට වධහිංසාවට ගොදුරුවූ බව එක් සාක්ෂිකරුවකු විස්තර කරන අතර මේ කාලය තුල ඔහු එම කඳවුරේ රඳවා තබා සිටි බව තහවුරු කරමින් ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය දුන් සහතිකයක්ද ඔහු වෙත තිබේ. ඔහුගේ ඇඟ පුරා අතුල් පහර දී, තුවාල වලට ගුටි ඇන, ඔලුව වතුර බැරලයක ඔබා පතුල් වලට බරපතල ලෙස පහර දී තිබේ. තමන් CID ලෙස හඳුන්වාගත් සිවිල් ඇඳුම් හැඳි පුද්ගලයන් දෙවතාවක්ම පිටතින් පුනරුත්ථාපන කඳවුරට පැමිණි බව ඔහු පවසයි.

***ඕමන්තෙයි මහා විද්‍යාලය:*** මෙම කඳවුරේ රදවා සිටියදී CID, TID සහ හමුද බුද්ධි අංශයද ඇතුළු සොල්දදුවන් තමන්ට වද දුන් බව සාක්ෂිකරුවකු පවසන අතර ඔහු 2009 මැයි මාසයේ එහි සිටි බව සනාථ කිරීමට ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ ලිපියක් තිබේ.

***කෝවිල්කුලම් මහා විද්‍යාලය:*** මෙහි රඳවා සිටියදී අතුල් පහර දී, මුෂ්ටි ප්‍රහාර දී, බූට් සපත්තු දැමූ පයින් ඇන, පොලු, බැටන් පොලු සහ වැලි පිරවූ පයිප්ප බටවලින් පහර දෙන ලද බව සාක්ෂිකරුවකු පවසයි. ඔහුගේ හිස වතුරේ ගිල්වා යටි පතුලට පහර දී තිබේ. මෙහි සිටියදී ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නිලධාරීන් විසින් 2009 දී ඔහුද මුණ ගැසී තිබේ.

**(ඇ) පුනරුත්ථාපනය සඳහා පවතින නෛතික රාමුව**

තම පුනරුත්ථාපන වැඩසටහන හිටපු දෙමළ සටන්කාමීන්ගේ මානසිකත්වය වෙනස් කිරීමේ අරමුණින් යුතුව වෘත්තීය පුහුණුව, භාවනාව සහ අධ්‍යාපනය ලබාදෙන බවට ශ්‍රී ලංකාවේ රජය පාරම් බා තිබේ.

"එල්ටීටීඊ කාඩරයන්ට නඩු පැවරීමේ දණ්ඩනීය යුක්තියේ සුපුරුදු මාවත ගනු වෙනුවට හිටපු එල්ටීටීඊ කාඩර්වරුන් පුනරුත්ථාපනය කොට නිදහස් කර යැවීමේ ප්‍රතිෂ්ඨාපන යුක්ති උපායමාර්ගයක රජය විසින්

ආයෝජනය කරන ලදී. මෙත්තාවෙන් හැඩගැන්වුනු සංස්කෘතියකින් පෝෂණය වී ඇති ශ්‍රී ලාංකිකයන් කිසිවකුත් එල්ටීටීඊ කාඩර්වරුන්ට තවත් අවස්ථාවක් ලබා දීමට විරෝධය පල කරන්නේ නැත...[33]"

ආණ්ඩුවේ සැලසුම වූයේ එල්ටීටීඊය පරාජය කළ ආරක්ෂක හමුදා වලටම ආරම්භයේ සිට ඔවුන් පිළිබඳ තක්සේරු කිරීමට බාර දීමය.

"හිටපු සටන් කරුවන් ලෙස හඳුනාගනු ලැබූවන් 'සම්බන්ධ වී ඇති ප්‍රමාණය' සිද්ධියෙන් සිද්ධියට විමසා බලා තීරණය කිරීම ත්‍රස්තවාදී විමර්ශන දෙපාර්තමේන්තුව (TID), අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID), හමුදා බුද්ධි බලකාය (MIC) සහ නීතිපති දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතන හතර විසින් සිදු කරනු ලැබේ. වගකීම හෝ එසේ නොමැතිකම නීතිපති විසින් තීරණය කෙරෙනු ඇති අතර අවසානයේදී ඒ වන විට පවතින සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයකට යොමු කෙරෙනු ඇත[34]."

පුනරුත්ථාපන කඳවුරු ඉදිකර තිබුනේම කෙලෙසීම් සිදු කිරීමට ඉඩ සැලසෙන ආකාරයෙනි. විස්සකට වැඩි "පුනරුත්ථාපන"කඳවුරු පවත්වාගෙන ගිය කාලය හෝ ඒවායේ නම් හෝ දැක්වෙන අංග සම්පූර්ණ පාරදෘශ්‍ය ලැයිස්තුවක් මේතාක් එළි දක්වා නොමැත. මේ ක්‍රියාදාමය හරහා ගිය පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳවද කිසිදු පැහැදිලි අදහසක් නැත. ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) 2010 දී ශ්‍රී ලංකාව හැඳින්වූයේ "ලෝකයේ දැවැන්තම පරිපාලනමය රැඳවුම පවත්වාගෙන යනු විය හැකි," රට ලෙසයි. 2009 අගෝස්තුව දක්වා ගම්ලත් මහතාගේ විෂය පථය යටතේ පැවති "පුනරුත්ථාපන" කඳවුරු ගැන ඔවුන්ගේ වාර්තාවක සඳහන් වුනේ මෙලෙසය:

"ආණ්ඩුවේ 'භාරවීම්' සහ 'පුනරුත්ථාපන' තන්ත්‍රය ජාත්‍යන්තර නීතියට හා ප්‍රමිති වලට අනුකූල නොවීම මගින් නිදහස, නිසි පිළිවෙත සහ සාධාරණ නඩු විභාග අනතුරේ හෙලා තිබීම ගැන ICJ සිය බලවත් අවධානය යොමු කර සිටී. වධහිංසා සහ බලහත්කාර අතුරුදහන් කිරීම් ගැනද පැමිණිලි ලැබී ඇත. විශ්වසනීය සහ නිවැරදි අධීක්ෂණය සඳහා ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය ඇතුළු ජාත්‍යන්තර ආයතන වලින් ඉල්ලා ඇති ප්‍රවේශ අවසර ප්‍රතික්ෂේප කොට ඇත. නීතිගරුක භාවය හා වගවීම යටපත් කොට ඉදිරියට පැමිණ ඇත්තේ දේශපාලන උවමනාව සහ රහසිගත භාවයයි.[35]"

එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලය 2011 දී මෙසේ ප්‍රකාශ කළේය:

"වෙනම පවත්වාගෙන යන මේ 'භාරවූවන්ගේ' අඩවිවල තත්වය සම්බන්ධයෙන් කිසිම තොරතුරක් නැති තරම්ය. ඊට හේතුව වී ඇත්තේ ආන්ඩුව හිතා මතාම පාරදෘශ්‍ය නොවන අයුරින් කටයුතු කිරීමයි. කිසිදු බාහිර සුපරීක්ෂාවකින් තොරව ප්‍රශ්න කිරීම්, විභාග කිරීම් සහ 'පුනරුත්ථාපනය' කිරීම් පවත්වාගෙන යාමෙන් සිදු වන්නේ දණ්ඩ මුක්තියකින් තොරවම දූෂණය, වධහිංසාව සහ අතුරුදහන් වීම වැනි කෙලෙසීම් වලට එල්ටීටීඊ චූදිතයන් ගොදුරු කර ගැනීමට මග පෑදීමයි (167 ඡේදය)[36]."

"පුනරුත්ථාපන" වැඩ සටහන ක්‍රියාත්මක කෙරුනේ ශ්‍රී ලංකාවේ හදිසි නීති රෙගුලාසි යටතේය. ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විමර්ශනය අනුව (OISL, 2015, 339 ඡේදය), එමගින් "මේ රෙගුලාසි ක්‍රියාවේ යෙදවීමේදී නිලධාරීන්ට නඩු පවරනු ලැබීමෙන් ගැලවී යා හැකි පුළුල් දණ්ඩ මුක්තියක් අත් කර දෙන ලදී". හදිසි නීතිය අහෝසි වී යන්නට 2011 දී ඉඩ සලසා දෙන ලද[37] නමුත්, ඊට පෙර "පුනරුත්ථාපන" කාර්යාවලියේ යෙදී සිටි නිලධාරීන් තවමත් දණ්ඩ මුක්තිය භුක්ති විඳින්නේදැයි පැහැදිලි නැත. එසේනම්, 2015 එක්සත් ජාතීන්ගේ යෝජනාව පරිදි ශ්‍රී ලංකාව රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් පවත්වාගෙන යන්නට පොරොන්දු වූ පූර්ව සෝදිසි ක්‍රියාදාමය එමගින් විගඩමක් බවට පත් කෙරෙනු ඇත.

---

[33] Reconciliation after Terrorism: The Sri Lankan Experience, Asanga Abeygoonasekera and Rohan Gunaratna, http://dbsjeyaraj.com/dbsj/archives/10144

[34] National Framework Proposal for Reintegration of Ex-combatants into Civilian Life in Sri Lanka.

[35] Beyond Lawful Constraints: Sri Lanka's Mass Detention of LTTE Suspects, ICJ, September 2010.

[36] REPORT OF THE SECRETARY-GENERAL'S PANEL OF EXPERTS ON ACCOUNTABILITY IN SRI LANKA, 31 March 2011, http://www.un.org/News/dh/infocus/Sri_Lanka/POE_Report_Full.pdf

[37] Sri Lanka: 'Bait and Switch' on Emergency Law, 7 September 2011, Human Rights Watch, https://www.hrw.org/news/2011/09/07/sri-lanka-bait-and-switch-emergency-law.

චෝදනා ගොනු කිරීමකින් හෝ නඩු පැවරීමකින් තොරව අවුරුදු දෙකක් දක්වා රැඳවුම දීර්ඝ කළ හැකි ආකාරයෙන්, "පුනරුත්ථාපන" වැඩ පිළිවෙලේ දී හබයාස් කෝපුස් අයිතිය අත් හිටවා ඇති බව එක්සත් ජාතීන්ගේ එම වාර්තාවේම (361ඡේදය) විස්තර කර තිබේ. යමකු එල්ටීටීඊ සංවිධානයේ කෙතරම් බලවත් සාමාජිකයකුද යන්නත්, පුද්ගලයන් කොයි තරම් කල් සිරගත කොට සිටිය යුතුද යන්නත් පිළිබඳ තීන්දු ගනු ලැබුවේ හිතු මතේය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය වැඩිදුරටත් මෙසේ කියයි.

*"පුනරුත්ථාපන ක්‍රියාකාරකම් ස්වල්පයක් සහිත හෝ කිසිත් නැති මේ ස්ථාන වැඩි හරියක් රැඳවුම් මධ්‍යස්ථාන හා සමාන බවට පැමිණිලි ලැබී තිබේ. බොහෝ "භාරවුවන්" සම්බන්ධයෙන් ගත් කල "ආරක්ෂිත වාසස්ථානයක සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක" රඳවා තබා ගැනීම පරිපාලන රැඳවුමක තබා ගැනීමට සමානය."*

පුළුල් ලෙස වාර්තා වී තිබුනත්, තවමත් විමර්ශනය කොට නැති "පුනරුත්ථාපනය" හා බැඳුනු වංචා දූෂණ පිළිබඳ තවත් ගැටලුකාරී අංගයක්ද තිබේ. එක්සත් ජාතීන්ගේ වාර්තාව 2015 දී මෙසේ කියා ඇත:

*"OISL විසින් වාර්තා කර ඇති සිද්ධි 16 කදී මෙන්ම වෙනත් අය විසින් වාර්තා කර ඇති පරිදි ද, නිදහස ලබා ගැනීමට හැකිවී ඇත්තේ රැඳවියාගේ පවුලේ සාමාජිකයකු විසින් විශාල අල්ලසක් දීමෙන් අනතුරුවය. බොහෝ විට ඒ අතරමැදියන් මගිනි. එවන් අතරමැදියකු ලෙස පොදුවේ කියැවුනේ EPDP සංවිධානයේ නමයි. රැඳවියන් නිදහස් කර යැවීමට මුදල් ලබා ගැනීම පුළුල් ලෙස ව්‍යාප්ත වුනු බවක් දිස්වේ. රඳවා සිටි පුද්ගලයන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් බවට බලධාරීන් කියන කතාවලට එය සම්පූර්ණයෙන්ම පරස්පර වෙයි." (383 ඡේදය)*

### (ඈ) "පුනරුත්ථාපන" වැඩසටහනේදී වධහිංසා කළ බවට නගන චෝදනා විභාග කිරීමට ඉල්ලීම

"පුනරුත්ථාපනයේදී" පුද්ගලයන්ට වධදීම පිළිබඳව විශ්වසනීය මූලාශ්‍ර විසින් මෑතදී නගන ලද චෝදනා සම්බන්ධයෙන් අවධානය යොමුවී ඇති බව ඉතා මෑත 2016 දෙසැම්බරයේදී ප්‍රකාශ කළ වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව එම වැඩසටහන අහෝසිකරන ලෙස ඉල්ලා සිටියේය. "පුනරුත්ථාපන" වැඩසටහන දිගටම පවත්වාගෙන යාමත්, තෝරාගැනීමේ වර්ගීකරණය, රඳවා තබා සිටින තත්වය සහ අධිකරණමය අධීක්ෂණය පිළිබඳ පාරදෘශ්‍ය භාවයක් නැතිවීමත් සම්බන්ධයෙන් එහි සැලකිල්ල යොමුවී තිබුනි (25 ඡේදය)[38]. "පුනරුත්ථාපන" මධ්‍යස්ථාන වල වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා අපක්ෂපාතී සහ පලදායී ස්වාධීන යාන්ත්‍රණයක් වහාම ස්ථාපිත කරන ලෙස එය ශ්‍රී ලංකාවට නිර්දේශ කළේය (26 ඡේදය). එම නිර්දේශය ක්‍රියාවේ යෙදවීමට අපේක්ෂා කරන්නේදැයි දන්වා නැති ශ්‍රී ලංකා රජය අපකීර්තිමත් "පුනරුත්ථාපන" කාර්යදාමය දිගටම පවත්වාගෙන යයි.

*"පුන්තෝට්ටම් පුනරුත්ථාපන කඳවුර වසාදමා එහි හෝ වෙනත් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක හෝ ඉතිරිව සිටින සියලු දෙනා කොන්දේසි විරහිතව නිදහස් කළ යුතුය,[39]"* යන්න වධහිංසාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත හුවාන් මෙන්දෙස් ශ්‍රී ලංකාව සම්බන්ධ සිය වාර්තාවේ කළ නිර්දේශ අතරින් එකක් විය.

### (ඉ) අක්ෂෝන් කොන්ත්‍ර ල ෆේම් (ACF) ඝාතන

මුතූර් ආසන්නයේ පිහිටි කන්තලේ සිට කිලෝමීටර් සියයකටත් එහා පිහිටි අනුරාධපුර අධිකරණයට ACF මූලික නඩු විභාගය මාරුකර යැව්වේ අධිකරණ අමාත්‍යාංශ ලේකම් වශයෙන් සිටි ගම්ලත් මහතා බව මාධ්‍ය වාර්තා කියයි[40]. හමුදා බලකොටු සහිත සිංහල නගරයක් වන අනුරාධපුරයට ගමන් කිරීම දෙමළ සාක්ෂිකරුවන්ට දුෂ්කර කටයුත්තක් විය[41]. ගම්ලත් මහතා දුන් නියෝගය මුතූර් මහේස්ත්‍රාත්වරයා ගේ නිල ලේඛනයෙන් වාචිකව දක්වනු ඇතැම් වාර්තාවල සඳහන් කර තිබේ[42] . අධිකරණ සේවා කොමිසම්

---

38 UNCAT Concluding Observations, December 2016.

39 A/HRC/343/54/Add.2, Published 25 January 2017.

40 "On September 5, the preliminary judicial inquiry was shifted from the courts in Kantalai, near Muttur, to Anuradhapura, more than 100 kilometres away. Justice Ministry Secretary Suhada Gamlath ordered the transfer in breach of basic legal procedure. According to Sri Lankan law, any initial inquiry has to be conducted in the same judicial area where the crime took place", Sri Lankan government manipulates inquiry into massacre of aid workers, 29 September 2006, by Nanda Wickramasinghe, https://www.wsws.org/en/articles/2006/09/sril-s29.html

41 "The fact that the transfer was by political order (ie; Justice Secretary) shows the manner in which the court proceedings are sought to be subverted and very blatantly at that. Anuradhapura is situated in the North Central province (a predominantly Sinhala area) where the perception as well as the reality being that, given the

සභාවට විනා අමාත්‍යාංශ ලේකම් ට නඩු මාරු කර යැවීමේ අධිකාරියක් නැති තත්වයක් යටතේ කරන ලද මේ කටයුත්ත වින්දිතයන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා විසින් හඳුන්වන ලද්දේ එළිපිටම කරන ලද දේශපාලන ඇඟිලි ගැසීමක් ලෙසය.

**(ඊ) ත්‍රිකුණාමල පංච ශිෂ්‍ය ඝාතනය**

ත්‍රිකුණාමලයේ ඝාතනය කරන ලද ශිෂ්‍යයන් පස් දෙනාගෙන් එක් අයකුගේ පියා විසින් කරන ලද නෛතික අභියෝගයකට මුහුණ දුන් විට ජනාධිපතිවරයා නඩු නොවැටීමේ මුක්තියක් විඳින බවට තර්ක කරමින් ගම්ලත් මහතා 2011 දී අධිකරණ අමාත්‍ය ලේකම් වශයෙන් සිටියදී ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙනුවෙන් පෙනී සිටි බව මාධ්‍ය වාර්තා සඳහන් කරයි[43] . මෙයින් අදහස් වන්නේ සංකේතාත්මක සිදුවීමක වින්දිතයන්ට එරෙහිව ගම්ලත් මහතා රජය වෙනුවෙන් පෙනී සිටි බවයි. එය ශ්‍රී ලංකාවේ "අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ආයතනගත බිඳවැටීම හුවා දක්වන," බව එක්සත් ජාතීන්ගේ OISL 2015 වාර්තාව කියයි. මෙය තර්ජන වලට බියේ සාක්ෂිකරුවන්ට රට හැර පලා යාමට සිදුවූ එක් නඩුවක්ද වෙයි. එක්සත් ජාතීන්ගේ වාර්තාව (272 ඡේදය) මෙසේ කියයි. *"පොලිස් විශේෂ කාර්ය සාධක බලකාය ඇතුළු ආරක්ෂක හමුදා නිලධාරීන් විසින් ශිෂ්‍යයන් පස් දෙනා ඝාතනය කරන ලද බව විශ්වාස කිරීමට සෑහෙන හේතු සාධක තිබේ. ශ්‍රී ලංකාවේ සන්දර්භය තුල එවැනි චූදිත අපරාධ සම්බන්ධයෙන් වගවීම දේශීය මට්ටමින් හඹා යාමේදී මුහුණ දෙන්නට සිදුවන අභියෝග මෙම සිදුවීම මගින් විශද වේ."*

**(උ) සබැඳියා අතර ගැටුම්**

කොළඹ සිවිල් සමාජ නියෝජිතයන් කිහිප දෙනකු සහ මානව හිමිකම් කොමසාරිස් වරුන් ජාතික අධිකාරිය සමග විවිධ කටයුතු වලට සහභාගි වී සිටියදී[44] සබැඳියා අතර ගැටුම් සම්බන්ධයෙන් ඔවුන් කරුණු මතු කළ බවට මාධ්‍ය වාර්තා කියා පායි. කෙසේ වෙතත්, මූලාසනයේ සිටි ගම්ලත් මහතා එම ගැටුම් ඇති බව පිලිගෙන තිබීම සිත්ගන්නා සුළු කාරණයක් වුවත්, ඒ ගැටලුව නිරාකරණය කිරීමට ඔහු පියවර ගත් බවක් ප්‍රසිද්ධියේ තිබෙන තොරතුරු වලින් දැනගන්නට නැත[45] .

හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් පිහිටුවන ලද ඇවන්ට් ගාර්ඩ් පුද්ගලික ආරක්ෂක සමාගම ට එරෙහි චෝදනා සම්බන්ධ පරීක්ෂණය මෙහෙයවන ලද්දේ ගම්ලත් මහතා විසින් බව මාධ්‍ය වාර්තා වල දැක්වේ[46] . පරීක්ෂණය යට ගසන බවට ගම්ලත් මහතා අමාත්‍යවරයකුගේ ද චෝදනාවට ලක්විය[47] .

---

extraordinary sensitivity of this case, witnesses will be reluctant to attend as opposed to the matter being continued in Trincomalee", Why the State is not the LTTE and vice versa, Kishali Pinto Jayawardena,10 September 2006, The Sunday Times Lanka, http://www.sundaytimes.lk/060910/Columns/Focus.html

42 "Hon. Mr. Suhada Gamlath through phone directed me to send the file to Hon. Magistrate Anuradhapura to handle the file on the instructions of the J.S.C. I send the file to Hon. Magistrate Anuradhapura today itself (4/9/06). Mr. Jegasothy (AAL) requested certified copy of the entire proceeding. Issue certified copy. M. Ganesharajah, Magistrate, Muttur", Sri Lanka: Subverting justice regarding the Muttur killings and repeating the legacy of immunity for gross abuses of human rights, 11 September 2006, http://reliefweb.int/report/srilanka/sri-lanka-subverting-justice-regarding-muttur-killings-and-repeating-legacy

43 Mr. President "You Have Been Served, 2011,Frederica Jansz, The Sunday Leader, says: "Suhada Gamlath, Secretary to the Ministry of Justice on June 18, wrote to Rick Hamilton in the USA asserting that it would be seriously prejudicial to Sri Lanka's sovereignty for the Central Authority to facilitate proceedings in the Manmoharan lawsuit against President Rajapaksa. This was mainly because, as Head of State of Sri Lanka, President Rajapaksa is absolutely immune from the jurisdiction of the courts of the United States. Also that the claims against President Rajapaksa for actions allegedly taken under his command responsibility as Head of State, head of Government and Commander in Chief of the Armed Forces of Sri Lanka, are in substance claims against Sri Lanka itself, for which both Sri Lanka and President Rajapaksa are entitled to sovereign immunity from suit."

44 New police division to be opened soon to protect crime victims and witnesses, 11 September 2016, Namini Wijedasa, Sunday Times, http://www.sundaytimes.lk/160911/news/new-police-division-to-be-opened-soon-toprotect-crime-victims-and-witnesses-208415.html

45 "Mr. Gamlath admitted that areas of possible conflict have to be addressed if the State was serious about making the system work". Ibid.

46 AG To Retire On January 09: Wijeyadasa Pushing Suhada Gamlath As New AG , 30 December 2015, Asian Mirror, http://www.asianmirror.lk/news/item/13762-ag-to-retire-on-january-09-wijeyadasa-pushingsuhada-gamlath-as-new-ag

47 (a) "Rajitha once accused that the Attorney General and Suhada Gamlath were behind the move to suppress the Avant Garde probe and allow the proprietor of Avant Garde to travel overseas. Suhada Gamlath left the AG's Department to take up the position of Secretary to the Justice Ministry, another appointment made by Mahinda. It was no secret that Mahinda ignored the Justice Minister and ran the Justice Ministry via Suhada Gamlath. During the period Yuwananjan was AG and Suhada was Acting AG, the Maithri-Ranil Government submitted 37 cases through the FCID for necessary advice. The AG's Department acted only on eight cases. The fate of the remaining 29 cases is yet unknown". Who is hiding files of Rajapaksas in AG's Department?, 17 February 2016, Upul Joseph Fernando., 17 February 2016, Upul Joseph Fernando., Sri Lanka Guardian, http://www.slguardian.org/2016/02/who-is-hiding-files-of-rajapaksas-in-ags-department/ .

(b) Sri Lanka: Avant Garde Sordid Saga & the National Security, 13 October 2015, Sri Lanka Guardian. And: "Deputy Minister of Power Ajith P. Perera proposed that the attorney-general and the police chief are to be summoned to Parliament and questioned on their conduct over the Avant Garde case". The Avant Garde issue is not over, 9 November 2015, Daily Mirror Lanka, http://www.dailymirror.lk/94605/the-avant-gardeissue-is-not-over#sthash.4ShWmonc.dpuf .

(c) "The President had summoned Attorney General Yuwanjana Wanasundera to attend the meeting along with Additional Solicitor General Wasantha Navaratne Bandara. Unlike the Attorney general, his deputy Bandara had maintained there was sufficient grounds to arrest Gotabhaya Rajapaksa and prosecute Avant Garde, but his opinion had been overruled. Government sources said Bandara had been prevented from attending the meeting and instead controversial Solicitor General Suhada Gamlath had been present to answer questions about the slow pace of AG's department work", Sri Lanka to prosecute Avant Garde, revokes 'agreement', 11 November 2015, Economy Next.

(d) "At a meeting of the committee, when Anura Kumara Dissanayake, the JVP leader and Champika Ranawaka, the JHU leader raised questions, Solicitor General Suhada Gamlath could not keep quiet. He disclosed that Marapana directed him not to object when an application is made to have the passport of Senadipathi

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ විරෝධය ද නොතකා මරණ දඬුවම වෙනුවෙන්ද ගම්ලත් මහතා පෙනී ඉන්නා බව මාධ්‍ය වාර්තා පෙන්වා දෙයි[48] .

**2.3 යසන්ත කෝදගොඩ**

1989 දී නීතිපති දෙපාර්තමේන්තුවට බැඳුනු යසන්ත කෝදගොඩ 2005 දී රාජපක්ෂ පාලනය විසින් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ධුරයටත් ඉන් අනතුරුව 2015 දී සිරිසේන පාලනය විසින් අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයටත් පත් කරන ලදී[49] . ඔහු කොතලාවල ආරක්ෂක ඇකඩමියේ බාහිර කථිකාචාර්යවරයකුද වෙයි[50] .

ආණ්ඩු කීපයක් යටතේ සිදුවූ බරපතල මානව හිමිකම් උල්ලංඝන යටපත් කළ බවට චෝදනා ලබන අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදගොඩගේ අවංක භාවය සහ අපක්ෂපාතිත්වය පිළිබඳව බරපතල ගැටළු මතුවී තිබේ.

පුවත්පතක් සමග පැවැති සම්මුඛ සාකච්ඡාවකදී 2015 දී සම්මත කරගන්නා ලද සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අලුත් පනතේ ගුණ වර්ණනා කරමින් කෝදගොඩ මහතා අවධාරණය කළේ වධහිංසනය, නීතිවිරෝධී අත් අඩංගුවට ගැනීම් සහ නීතිවිරෝධී රඳවා ගැනීම් චෝදනා සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කරන වින්දිතයන් සහ ආයතනික අයථා කටයුතු හෙලිකරන්නවුන් ගේ ආරක්ෂාව සඳහා මේ නීතිය යොද ගත හැකි බවය. *"දේශපාලනික හෝ වෙනත් ඇඟිලි ගැසීමකින් තොරව මහත් ස්වාධීනත්වයකින් යුතුව කටයුතු කරන්නට පොලිසියට නිසැකයෙන්ම කටයුතු කරන්නට සිදුවනු ඇත,[51] "* යි කෝදගොඩ මහතා පවසා තිබේ. වධබන්ධන සම්බන්ධයෙන් නොවිසඳුනු චෝදනා දහස් ගණනක්[52] සහ දශක ගණනාවක පොලිස් අපචාර ද ගත් කල පොලිසිය ස්වාධීනව කටයුතු කරනු ඇතැයි හෝ ඒ සඳහා පොලිසියට හැකියාවක් ඇතැයි හෝ ITJP විශ්වාස නොකරයි.

**(අ) පුද්ගලයන් අතුරුදහන් වීම සම්බන්ධ දීප ව්‍යාප්ත ජනාධිපති කොමිසම (1998-2000)[53]**

නීතිපති දෙපාර්තමේන්තුව යටතේ වන ආගිය අතක් නැති පුද්ගලයන් පිළිබඳ ඒකකයට භාරදුන් සිද්ධි හා සම්බන්ධ පරීක්ෂණ පමාවීම හා සිදු නොවීම මෙන්ම දෙමළ පුද්ගලයන් ඝාතනය කිරීමට සම්බන්ධ බවට චෝදනා ලබන ආරක්ෂක අංශ නිලධාරීන් නිදහස් කර යැවීම ට අදළව ඔහුගේ භූමිකාව සම්බන්ධයෙන් කෝදගොඩ මහතා ගෙන් කොමිසම විසින් ප්‍රශ්න කරන ලදී.

1998 සිට 2000 දක්වා කොමිසන් විසින් අපරාධකරුවන් ලෙස චෝදනා ලබන දහස් ගණනක් හඳුනා ගෙන ඇතත්, වරදකරුවන් කර ඇත්තේ ඉතාම අල්පයක් වීම සැලකිල්ලට ගත යුත්තකි.

*"සිද්ධි 1000 කට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සැක කෙරෙන අපරාධ කරුවන් දහස් ගණනක් කලාපීය කොමිසන් විසින් හඳුනාගෙන තිබේ. මීට අමතරව, අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු බවට චෝදනා නැගෙන සිය ගණනක් දීප ව්‍යාප්ත කොමිසම විසින් හඳුනාගෙන තිබේ...දීප ව්‍යාප්ත කොමිසම විසින් තමන් වෙත යොමු කරන ලද පැමිණිළි 16,305 ක් පරීක්ෂා කිරීම 1994 දී ආරම්භ කළ කොමිසම විසින් වැඩිදුර විමර්ශනය කළ යුතු සිද්ධි 2,127 ක් හඳුනා ගන්නා ලදී. කෙසේ වෙතත්, "රජයෙන් විශේෂ උපදෙස් නොලැබුනොත්..." මේ සිද්ධි පිළිබඳ විශ්ලේෂණ තව දුරටත් නොකිරීමට මානව හිමිකම් කොමිසම*

---

returned for him to travel to Nigeria. Gamlath said he checked with Justice Minister Rajapakshe. He had said he was asked not to object and go slow with the case". Justice Minister Wijeyadasa Corrupt Since Time Of COPE Chairmanship: Photos Reveal, 10 December 2015, Colombo Telegraph, https://www.colombotelegraph.com/index.php/justice-minister-wijeyadasa-corrupt-since-time-of-copechairmanship-photos-reveal/

48 Sri Lanka considering death penalty again, The Hindu, 26 July 2009, http://asiadeathpenalty.blogspot.co.uk/2009/08/sri-lanka-considering-death-penalty.html; Justice Ministry

49 Additional Solicitor General and President's Counsel, 22 February 2015, The Sunday Times Lanka, http://www.sundaytimes.lk/150222/plus/additional-solicitor-general-and-presidents-counsel-136590.html

50 එම

51 Victim and witnesses protection law finally through, 28 February 2015, Randima Attygalle, Sunday Island, http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=120448

52 Referred to by the Sri Lankan Foreign Minister, Mangala Samaraweera, in London at Chatham House, Sri Lanka FM has no excuse for sending spy chief to UN (Video), 16 January, ATHULA VITHANAGE, JDS Lanka

53 "On December 9, 1994, President Chandrika Bandaranaike Kumaratunga issued three Presidential Proclamations, appointing three different Commissions of Inquiry to look into the "Involuntary Removal or Disappearance of Persons" over the course of the conflict. The three Zonal Commissions were each responsible for the following provinces: i) the Central, North West, North Central and Uva Provinces; ii) the Northern and the Eastern Provinces; iii) the Western, Southern, and Sabaragamuwa Provinces. In 1998, the work of these three commissions was complemented by an "All Island" Commission, which was tasked to investigate cases that the Zonal Commissions were not able to address", Commissions of Inquiry: Sri Lanka, http://www.usip.org/publications/commissions-of-inquiry-sri-lanka

*2006 දී තීරණය කළේය. "කොමිසම් විසින් හඳුනා ගන්නා ලද අපරාධ සම්බන්ධයෙන් සැක කටයුතු දහස් සංඛ්‍යාත පිරිස අතරින් චෝදනා ගොනු කරනු ලැබුවේ 500 කටත් අඩු ගණනකටය. ඒ අතරින්ද වරදකරුවන් කෙරුනු සංඛ්‍යාව ඉතා අඩුය [54] "*

පුද්ගලයන් අතුරුදහන් වීම සම්බන්ධ දීප ව්‍යාප්ත කොමිසම ක්‍රියාත්මක වූයේ සිරිසේන ආණ්ඩුව විසින් පිහිටුවන ලද ජාතික සමගිය හා සංහිදියා කාර්යාංශයේ (ONUR) වර්තමාන ප්‍රධානී හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ගේ ආණ්ඩුවක් යටතේ බව මෙහිදී සඳහන් කළ යුතුය.[55]

**(ආ) උදලාගම ජනාධිපති කොමිසන් සභාව/ IIGEP 2007-2008**

උදලාගම කොමිසම පත් කරනු ලැබුවේ බරපතල මානව හිමිකම් උල්ලංඝන පිළිබඳ සිද්ධි 16ක් විභාග කිරීමටය. මේ අතර ACF ඝාතන සහ ත්‍රිකුණාමලයේ පස් දෙනාගේ ඝාතන ද විය (මේ සිද්ධි සහ ජාතික අධිකාරියේ තවත් සාමාජිකයකු වන සුහද ගම්ලත් සම්බන්ධයෙන් ඉහත 2.2 කොටසේ (ඉ) සහ (ඊ) ඡේද බලන්න).

කෝදගොඩ මහතා සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් ආසියානු මානව හිමිකම් කොමිසම විසින් 2016 සැප්තැම්බරයේදී සිරිසේන ආණ්ඩුවට විවෘත ලිපියක් ලියන ලදී.

*"එම කොමිසම අධීක්ෂණයේ යෙදුනු ජාත්‍යන්තර ස්වාධීන අද්වීතීයයන් කණ්ඩායමේ (IIGEP) සාමාජිකයන් විසින් කෝදගොඩ මහතා විශේෂයෙන්මද, නිශේධනීය ලෙසද නම් කර තිබෙන කල උදලාගම පරීක්ෂණ කොමිසම ඉදිරියේ ඔහුගේ ප්‍රසිද්ධ භූමිකාව මනා ලෙස ප්‍රසිද්ධය. කෝදගොඩ මහතා නීතිපති වෙනුවෙන් කොමිසමේ පෙනී සිටි ප්‍රධාන නීතිවේදියා විය. ඒ කොමිසම විසින් විමර්ශනය කරනු ලැබූ, නිසි ලෙස පරීක්ෂණ පවත්වා නඩු පැවරීමට රාජ්‍ය නිලධාරීන් අසමත් වූ සමහර බරපතල මානව හිමිකම් උල්ලංඝන සිද්ධි පිළිබඳ මූලික පරීක්ෂණ වලදී ඔහු උපදේශකයකු ලෙසින් සම්බන්ධ වී තිබියදීත්ය. මෙය පැහැදිලිවම සබැඳියා අතර ගැටුමකි. මීට අමතරව, කොමිසමට සහාය වීම නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ භූමිකාව වී තිබියදී, කෝදගොඩ මහතා කොමිසම ඉදිරියට ආ සාක්ෂිකරුවන්ගෙන් සැඩ පරුෂ ලෙස හරස් ප්‍රශ්න විමසුවේ මේ සාක්ෂිකරුවන් විසින් එදිරිව සාක්ෂි දෙනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ආරක්ෂා කිරීමේ ප්‍රබල උත්සාහයක යෙදෙමිනි. බූස්ස කඳවුරේ දෙමළ සිරකරුවන් රඳවා තැබීම සම්බන්ධයෙන් ගත් කල[56], සාධාරණ හේතු නොමැතිව දෙමළ සිරකරුවන් අත් අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ඔහු විසින් වලකා ලන ලදී.[57]".*

මේ හා සමාන ප්‍රශ්න උදලාගම කොමිසමේ කටයුතු නිරීක්ෂණය කළ ජාත්‍යන්තර ස්වාධීන අද්වීතීයයන් කණ්ඩායම(IIGEP) විසින් මතුකර තිබේ[58]. 2006 ජනවාරියේ ත්‍රිකුණාමලයේදී තරුණයන් පස් දෙනකු ඝාතනය කර තවත් කිහිප දෙනකුට තුවාල කිරීම සහ 2006 අගෝස්තුවේ දී මුතූර් හිදී අක්ෂෝන් කොන්ත්‍ර ල ෆේම් (ACF) සහන සේවකයන් දහත් දෙනකු ඝාතනය කිරීම ඇතුළු විමර්ශනය කෙරෙන සිද්ධි කිහිපයකම සාක්ෂි ඒ ජාත්‍යන්තර විශේෂඥයන් විසින් විභාග කර බලන ලදී.

අදළ දිනයේ මුතූර් නගරය පාලනය කළ කවරකු වුවද ACF ඝාතන වලට වගකිව යුතු බවට විවෘත පරීක්ෂණ වලදී ද 2007 මැයි 14 ද පැවති සංවෘත විභාගයේද තර්ක කරමින් කෝදගොඩ මහතා එම ඝාතන එල්ටීටීඊයට පැටවීමට උත්සාහ කළ අයුරු IIGEP ක්‍රියාදමය සඳහා මූල්‍යාධාර සැපයුවන්ට ලබා දී ඇති රහස්‍ය වාර්තාවක සඳහන් වේ[59]. අදළ අවස්ථාවේ මුතූර් පාලනය පැවතියේ රජයේ කොමාන්ඩෝ බලකාය ඇතුළු වෙනත් ආරක්ෂක හමුද අත බව තහවුරු කෙරෙන, කෝදගොඩ මහතාද දැන සිටි ආණ්ඩුවේ මාධ්‍ය නිවේදනයක් ද ඇතුළු විවිධ සාක්ෂි තිබුනු බවට වාර්තාව චෝදනා කරයි[60]. ඉන් පසුව සම්පාදනය කරන ලද එක්සත් ජාතීන්ගේ වාර්තාවක් සටන් විරාම නිරීක්ෂණ කමිටුවෙන් (SLMM) ලැබුණු

---

[81] 54 එම

[55] ONUR වෙබ් අඩවිය : http://onur.gov.lk/index.php/en/about-onur

56 ඔහුත් සමග එකට ජාතික අධිකාරියේ සිටින නන්දන මුණසිංහ සේවය කළ TID විසින් මේ සිරකරුවන් සිරකොට තබා ගන්නට ඇත.

57 SRI LANKA: AHRC writes to the Ministers of Foreign Affairs and Justice on the Torture Committee under the National Human Rights Action Plan, 13 September 2016, Asian Human Rights Centre, http://www.humanrights.asia/news/ahrc-news/AHRC-STM-141-2016/?searchterm=yasantha

58 එම

59 "With regard to the ACF killings these claims caused controversy. The Daily News of 4th morning quoted cabinet spokesman Keheliya Rambukwelle claiming (on the 3rd night) that 'Muttur town is under the total control of the Security Forces'. But the same spokesman after the SLMM statement pointed to the security forces as the party most likely behind the ACF killings, maintained that the crime, committed around the 4th morning according to post mortem reports, was the work of the LTTE", according to University Teachers for Human Rights (Jaffna) Sri Lanka, Special Report No.30, 1 April 2008, http://www.uthr.org/SpecialReports/Spreport30.htm

60 මීට අමතරව රජයේ ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යවරයා BBC සිංහල සේවය සංදේශයට කියා තිබුනේ 3 දා රාත්‍රියේ මුතූර් ආණ්ඩුවේ පාලනය යටතට පත්ව තිබුනු බවයි.

තොරතුරු පදනම් කරගෙන මෙය තහවුරු කරගෙන මෙසේ පැහැදිලි නිගමනයකට එළඹ තිබුනි[61] . *"ACF කාර්ය මණ්ඩලය නඩු නොඅසා ඝාතනය කළේ ආරක්ෂක හමුදා සාමාජිකයන් බව විශ්වාස කිරීමට පිළිගත හැකි සාක්ෂි තිබේ* (238 ඡේදය)*."*

කොමිසම පිහිටවූ ආකාරයේම සබැඳියා අතර බරපතල ගැටුම් තිබේ. කොමිසමේ අධිකාර පත්‍රය කෙටුම්පත් කරන ලද්දේ යසන්ත කෝදාගොඩ විසිනි. ඔහු, අඩුම වශයෙන් ACF ඝාතන සම්බන්ධයෙන් හෝ මුල්ම සහ දිගටම කෙරීගෙන යන පරීක්ෂණ සඳහා නීතිපති උපදේශකයි. ඉන් අනතුරුව, කොමිසමේ ප්‍රධාන නීතිවේදියාත්, ඉන් අනතුරුව පරීක්ෂණ කොමිසන් සභා පනතේ සංශෝධන සහ සාක්ෂිකරුවන් ආරෂා කිරීමේ පනත් කෙටුම්පතේ කෙටුම්පත් කරුවා විය. ITJP සතුව පිටපතක් ඇති IIGEP රහස්‍ය වාර්තාවක සඳහන් වන පරිදි මේ සිද්ධි සම්බන්ධ එකදු විමර්ශනයක් වත් ජාත්‍යන්තර සම්මතයන් හා ප්‍රමිතීන් අසලකටවත් ගත නොහැක. 2015 එක්සත් ජාතීන්ගේ විමර්ශනය (236 ඡේදය) මෙසේ කියයි. *"මෙම සිද්ධි ප්‍රමාණවත් ලෙස විමර්ශනය කර නැත. එමගින් විදහා දැක්වෙන්නේ අපරාධ කරුවන් විසින් භුක්තිවිඳිනු ලබන දණ්ඩ මුක්තිය මුල් බැස ඇති ආකාරයත්, ශ්‍රී ලංකාවේ දේශීය මට්ටමින් වගවීම සහතික කිරීම සම්බන්ධයෙන් මුහුණ දෙන්නට සිදුවන අභියෝගයි...විධායකය මරණ පරීක්ෂණයට මැදිහත් වූ අතර දෙමළ ජනතාවට නඩු විභාග සඳහා පැමිණීමට අසීරු සිංහල පලාතක අධිකරණයකට නඩුව මාරු කර යවන ලදී. නඩුව මුලින් විභාග කළ මහේස්ත්‍රාත් වරයාට තර්ජනය කරන ලදී."*

රජයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයකු සහ ආරක්ෂක හමුදාවේ ඉහල නිලධාරීන් සාක්ෂිකරුවන්ට තර්ජනය කළ හෝ නිහඬ කිරීමට නැතහොත් බොරු සාක්කි දීමට හෝ රටින් පලායාමට බල කළ බව IIGEP විශේෂඥයන් තම රහස්‍ය වාර්තාවේ ලියා තිබේ. එම ප්‍රකාශය එක්සත් ජාතීන්ගේ පරීක්ෂණයකින් පසුව තහවුරු කර ඇත:

*"සිදුවීම් වලින් ටික කලකට පසු මරාදමන ලද ශිෂ්‍යයන්ගේ ඥතීන්ට ලිඛිත ඒවාද ඇතුලත් තර්ජන ලැබෙන්නට පටන් ගත්තේය. ඔවුන්ගේ ගෙවල් වලට ගල් ගසන ලදී. රාත්‍රියේ ඔවුන්ගේ නිවෙස් වල විදුලිය කපා හරින ලද අතර මුර කපොලු සහ වෙනත් ප්‍රසිද්ධ ස්ථාන වලදී ඔවුන්ට හිරිහැර කරන ලදී... නිහඬව හිඳීම ප්‍රතික්ෂේප කළ එක් ඥතියකුට දුරකතනයෙන් කතා කළ ආණ්ඩුවේ ඇමැති වරයකු ප්‍රකාශ කර තිබුනේ සිද්ධිය ගැන කතා නොකර සිටියොත් මුදලින් වාසි සලසන බවයි. පවුල් වල සාමාජිකයන්ට ගම් බිම් හැර යාමට බල කෙරුනු අතර අවසානයේදී ඔවුන්ට සිදු වූයේ රට හැර පලා යාමටයි."* (1238 ඡේදය)

කොමිසම කළේ IIGEP ආධාරයෙන් වීඩියෝ සම්බන්ධතා යොදගෙන පිටරට සිටින සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විමසීමයි. කෙසේ වෙතත්, වීඩියෝ සාක්ෂි වාචක ප්‍රයෝජනයට ගැනීම නීතිපති වරයාගේ උපදෙසින් කොමිසමේ සභාපති වරයා විසින් අත් හිටුවන ලදී. අන්තිමේදී 2008 දී සිදුවූයේ වීඩියෝ සාක්ෂි ලබාගැනීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන ලබාදීම ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතික්ෂේප කිරීම පමණක් නොව විදේශගත සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි නොගන්නා ලෙසට කොමිසට නියෝග කිරීමයි.

එළැඹිය හැකි එකම යුක්ති සහගත නිගමනය ලෙස IIGEP විශේෂඥයන් විශ්වාස කළේ ලැබෙන සාක්ෂි ආරක්ෂක අංශ වලට හානිකර බව කොමිසමේ නීතිඥ මණ්ඩලයේ සිටි කෝදාගොඩ මහතා මගින් ආණ්ඩුව දැනගන්නට ඇති බවයි. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා "රැකවල් සලසන නීති" ක්‍රියාත්මක කරන තුරු වීඩියෝ සාක්ෂි ලබා නොගන්නා ලෙස කොමිසමට නියෝග කර තිබීම සරදම් සහගතය. මෙය මිත්‍යාවක් වන්නේ මේ වින්දිතයන් හා සාක්ෂිකරුවන් විදේශවල ආරක්ෂිතව සිටින බව කොමිසම මෙන්ම කෝදාගොඩ මහතා ඇතුළු ආණ්ඩුවත් දැන සිටීම නිසායි.

සාක්ෂිකරුවකු හෝ සාක්ෂිකාරියක විදේශයක දුරස්ථව සිට සාක්ෂි දෙන විට එහි නීතිපතිවරයා විසින් අනුමත කරන ලද ආණ්ඩුවේ නියෝජිතයකු සිටිය යුතු සේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා වන නීති කෙටුම්පත සංශෝධනය කළේ කෝදාගොඩ මහතා බව IIGEP විශේෂඥයෝ පවසති. ආරක්ෂක අංශ වලට එරෙහිව සාක්ෂි දෙන කිසිවකුත් තමන් සිටින ස්ථානය ඔවුන් විසින් දැන ගනු ලැබීමට කැමැත්තක් නැති කල, මෙය අපරාධකරුවන් විනා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රමයක් වන්නේ නැත.

ආරක්ෂක හමුදා වලට එරෙහිව වැදගත් සාක්ෂි ලබා දිය හැකි දහස් සංඛ්‍යාත බහුතර දෙමළ සාක්ෂිකරුවන් හා පීඩිතයන් විදේශගතව පිටුවහලේ ඉන්නා කල මේ විධිවිධානය ශ්‍රී ලංකාවේ අනාගත සත්‍ය කොමිසම සහ විශේෂ අධිකරණ යාන්ත්‍රණය සම්බන්ධයෙන් මහත් ගැටළුවක් මතු කරයි[62] .

---

61 235 ඡේදය, OISL 2015 මෙසේ සඳහන් කරයි,"මේ ක්‍රියාව පසුපස ආරක්ෂක හමුදා හැර වෙනත් කිසිදු සන්නද්ධ කණ්ඩායමක් සිටිය නොහැක"

62 Press release: Exiled Victims Cannot Testify in Sri Lankan Embassies, 8 July 2016, ITJP, http://www.itjpsl.com/assets/press/8-july-2016-ITJP-press-release.pdf

**(ඇ) ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම**

කෝදගොඩ මහතාගේ අතීතය සැලකිල්ලට ගත් කල, ඉදිරි පස් අවුරුදු ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීමේදී වධහිංසාව පිළිබඳව කටයුතු කරන අනු කමිටුව භාරව කෝදගොඩ මහතා ආණ්ඩුව විසින් පත් කර තිබීම පුදුම සහගතය. මේ පත්කිරීම ජනමාධ්‍ය ඔස්සේ ද ප්‍රශ්න කරනු ලැබුවත් පලක් වූයේ නැත[63] .

**(ඈ) යුද අපරාධ සිදුවූ බව ප්‍රතික්ෂේප කිරීම**

මීට අමතරව ගත් කල, ප්‍රසිද්ධ රැස්වීම් වලදී කෝදගොඩ මහතා පවසා ඇත්තේ ශ්‍රී ලංකා යුද හමුදව නැගෙහිර නැවත අල්ලා ගත්තේ "සාමාන්‍ය වැසියන්ට කිසිදු හානියක් නොකර" බවයි. එක්සත් ජාතීන් සහ ස්වාධීන මානව හිමිකම් සංවිධාන විසින් දක්වා ඇති කරුනු මීට ප්‍රතිවිරුද්ධවය[64].

**2.4 අශෝක විජේතිලක**

විජේතිලක මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධුරය දක්වා ඉහලට නැගුනු ඉතා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකි[65]. පොලිසියේ විදේශ බුද්ධි දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ලෙස 2007 දී සේවය කළ ඔහු ඊළඟ අවුරුද්දේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ නියෝජ්‍ය පොලිස්පති බවට පත්විය. ඔහු 2006 දී පොලිස් විශේෂ දූෂණ වංචා විමර්ශන ඒකකයේ ප්‍රධානියාද විය[66]. ඔහු 2006 දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලද්දේ[67] 2002 සිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරේ සිටියදීය[68] . ඔහු වසර ගණනාවක් එම දෙපාර්තමේන්තුවේ සේවය කළ අයෙකි[69] . විජේතිලක මහතා ගැන නිශ්චිත චෝදනා නැතත්, යුද සමයේත්, ඉන් පසුවත් CID ය විසින් පවත්වා ගෙන යන ලද අඩවි වල පුළුල් ලෙස වධහිංසා කිරීම් සිදුවී ඇති කල මේ තරම් උසස් CID නිලධාරියකු සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව භාරව පත් කිරීම සුදුසුද යන්න පිළිබඳ ගැටළුවක් මතුවෙයි. සිදුවිය යුත්තේ පොලිස් ධුරාවලියෙන්ද, ආරක්ෂක සංස්ථාවෙන්ද ස්වාධීන වූද සාමාජිකයන් ප්‍රවේසමින් සහ මුළුමනින්ම පූර්ව සෝදිසියකට භාජන කරන ලද්දා වූද ස්වතන්ත්‍ර ආයතනයක් ලෙස අධිකාරිය පවත්වාගෙන යාමයි.

## 3. නිගමන

ජාතික අධිකාරියේ සියලුම සාමාජිකයන් නොවරදින සුළු ස්වාධීන පූර්ව සෝදිසියකට භාජන කළ යුතුව තිබුනි. එසේ වීනම් අඩුම වශයෙන් එයින් තිදෙනකු සාමාජිකත්වයෙන් ඉවත් කෙරෙන්නට ඉඩ තිබුනි. මේ පත්වීම් වල ස්වභාවය ගත් කල, නීතියේ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා වන දේශපාලන කැපවීමත්, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ඇත්ත උවමනාවකුත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සතුව ඇතිද යන ප්‍රශ්නය මතුවේ.

මානව හිමිකම් උල්ලංඝන වලට සම්බන්ධ බවට පිළිගත හැකි සාධාරණ හේතු ඇති හමුද සහ ආරක්ෂක අංශ නිලධාරීන් ඇතුල් වෙනත් රජයේ නිලධාරීන් වෙත්නම්, ඔවුන් සේවයෙන් පහ කිරීම සඳහා සුලමුල

---

[84] 63 One article said, “he has played a negative role in the prevention of torture” and added that “In addition, while the role of the Attorney General’s Department’s officers was to assist the Commission, Mr. Kodagoda aggressively cross examined the witnesses who came before the Commission, in a vigorous attempt to protect state agents against whom these witnesses were giving evidence. We are also aware that, regarding the detention of Tamil prisoners at Boosa camp, he prevented discussions on the arrest and detention of Tamil prisoners without grounds for reasonable suspicion,” AHRC said. Govt. Asked To Review Appointment Of Deputy Solicitor General Yasantha Kodagoda As Head Of ‘Torture Prevention’ Committee, 14 September 2016, Colombo Telegraph, https://www.colombotelegraph.com/index.php/govt-asked-to-review-appointmentof-deputy-solicitor-general-yasantha-kodagoda-as-head-of-torture-prevention-committee/ and original article at SRI LANKA: AHRC writes to the Ministers of Foreign Affairs and Justice on the Torture Committee under the National Human Rights Action Plan, 13 September 2016, AHRC, http://www.humanrights.asia/news/ahrcnews/AHRC-STM-141-2016/?searchterm=kodagoda

64 Us State Department report is an extraordinary rendition of events in Sri Lanka, 15 March 2008, http://federalidea.com/focus/archives/381

65 Nalanda College website, https://www.nalanda.sch.lk/alumni/police-officers and Sri Lanka Police website:  http://www.police.lk/index.php/special-events-/508-entrust-lanka-to-assist-police-rugby-team.  A 2014 writ petition cites him and Mr. Sisira Mendis (who was controversially sent by the Sirisena Government to Geneva as part of their 2016 delegation to the UN Committee Against Torture) as respondents.

66 SRI LANKA ANTICORRUPTION  PROGRAM, FINAL PROJECT COMPLETION REPORT, December 2007,   http://pdf.usaid.gov/pdf_docs/Pdack636.pdf, page 5.

67 Attack on Uthayan Newspaper, 2 May 2006, D B S Jeyaraj, Sangam.org, http://www.sangam.org/taraki/articles/2006/05-06_Uthayan_Attack.php?print=sangam

68 Ratwattes use courts against the law, The Sunday Leader, 2002 http://www.thesundayleader.lk/archive/20020106/news.htm

69 Nalanda College website as above.

සෙවීමේ ක්‍රියාදාමයක් වහාම ආරම්භ කළ යුතු බව වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව පවසා තිබේ[70] . එමෙන්ම, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය පොලිස් ධූරාවලියෙන් ස්වාධීන වූද, මුළුමනින්ම පූර්ව සෝදිසියට ලක් කරන ලද්දවූ ද සාමාජිකයන්ගෙන් සැදුම් ලත් එකක් විය යුතු බව එය විශේෂයෙන් සඳහන් කරයි (17,18 ඡේද)[71] .

## 4. නිර්දේශ

### ශ්‍රී ලංකාවේ ආණ්ඩුව

- යසන්ත කෝදාගොඩ, සුභද ගම්ලත් සහ නන්දන මුණසිංහ යන මහත්වරුන් ජාතික අධිකාරියෙන් ඉවත් කොට, පැහැර ගැනීම් සහ වධබන්ධන සම්බන්ධයෙන් කිසිම ආකාරයකින් හෝ නම ගෑවී නැති විශ්වසනීය මානව හිමිකම් වාර්තාවක් සහිත පුද්ගලයන් පත් කොට සබැඳියා අතර ගැටුම් සහිත අයකු වේ නම් ඉවත් කිරීම.
- ආණ්ඩුවේ නියෝජිතයකු සාක්ෂිකරුවා සිටින කාමරයේ නොඉඳ විදේශගත සාක්ෂිකරුවන් සහ වින්දිතයන්ට වීඩියෝ සම්බන්ධතා මගින් සුරක්ෂිතව සාක්ෂි දීමේ විධිවිධානත් ඇතුලත් කොට සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ නීති සංශෝධනය කිරීම.
- ක්‍රියාවේ යොදවන ආයතන වලට මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ විශ්වසනීය ඉතිහාසයක් ඇති නිර්ව්‍යාජ ලෙසම අපක්ෂපාතී සිවිල් සමාජ සාමාජිකයන් පත් කර සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීම සඳහා විශ්වසනීය ස්වාධීන ක්‍රමවේදයක් අනුගමනය කිරීම.
- වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා 2007 දී නිර්දේශ කළ පරිදි නන්දන මුණසිංහ මහතා වධහිංසා චෝදනා හා සම්බන්ධ සියලු නිල තනතුරු වලින් අත් හිටුවීම. පොලිසියෙන් ස්වාධීන වූ අපක්ෂපාතී ආයතනයක් යොදවා වහාම ඔහු පිළිබඳ විමර්ශනයක් කිරීම.
- පුනරුත්ථාපන කඳවුරු වල වධහිංසා පැමිණවීම් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් ස්වාධීන, අපක්ෂපාතී, කඩිනම් පරීක්ෂණයක් පැවැත්වීම ඇතුළු වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවේ 59 සැසි වාරයේ (UNCAT59) නිර්දේශ සියල්ල ක්‍රියාත්මක කිරීම. ගම්ලත් මහතා පුනරුත්ථාපන කොසාරිස් ජනරාල් වරයා වශයෙන් කළ කාර්ය භාරය විමර්ශනය කිරීමද මීට ඇතුලත් විය යුතුය.
- වැඩි නියෝජනයක් සහතික වන පරිදි ජාතික අධිකාරියට දෙමළ ජාතිකයන් සහ කාන්තාවන් වැඩියෙන් පත් කිරීම.

### වෙනත් ආණ්ඩු

- මහජන මුදලින් කෙරෙන පුහුණු කිරීම්, රැකියා සහ වෙනත් වැඩ සටහන් සඳහා ඡන්දයෙන් පත්වූ නිලධාරීන් ද ඇතුළු ශ්‍රී ලංකාවේ ආරක්ෂක සහ රජයේ නිලධාරීන් තෝරා ගැනීමට පෙර ඔවුන්ගේ සුලමුල සෙවීම. මේ ක්‍රියාකාරිත්වය පිළිබඳව වාර්තා කිරීමේදී පාරදෘශ්‍ය විය යුතු අතර ආරම්භයේ සිටම පරාමිතීන් පැහැදිලිව දක්වා දේශීය ආයතන මගින් කෙරෙන ස්වයං සෝදිසි මත විශ්වාසය නොතබා කටයුතු කළ යුතුය.
- එක්සත් ජාතීන්ගේ 30/1 යෝජනාව පිළිපැදීම සහ මානව හිමිකම් අඛණ්ඩව අධීක්ෂණයේදී මෙන්ම වරණීය බදු (GSP+) වැනි වෙළෙඳ සහන සැලසීමේදීත්, ශ්‍රී ලංකාව විසින් සිය ආරක්ෂක සහ රජයේ නිලධාරීන් පූර්ව සෝදිසියට ලක් කිරීම සහ සුලමුල සෙවීම කාර්ය සාධනය මැන බැලීමේ ප්‍රධාන දර්ශකයක් ලෙස සැලකීම. සමස්ත සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදාමය හෝ නීති සංශෝධන හෝ සිදු කිරීමේ අවශ්‍යතාවක් පූර්ව සෝදිසිය සඳහා පැන නොනගී; එය වහාම ආරම්භ කළ යුතුය.

70 Concluding Observations on the fifth periodic report of Sri Lanka, UNCAT, December 2016, Available online at http://www.itjpsl.com/assets/Concluding-observations-englishUNCAT-59.pdf

71 එම